# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2473/30 - 2026 ජනවාරි මස 30 වැනි සිකුරාදා - 2026.01.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

### 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 7(1) (ඇ) වගන්තිය සහ VI වන කොටස සමග කියවිය යුතු 105 වගන්තිය යටතේ සකස් කළ රීති.

පී. නන්දලාල් වීරසිංහ,
පාලක මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2026 ජනවාරි මස 30 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ.

**අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒම**

1. මෙම රීති "2026 අංක 01 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අතර මෙම රීති පාර්ලිමේන්තුව විසින් අනුමත කරන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2024 ජූලි මස 01 වන දිනැති අංක 2391/02 දරන *(අති විශෙෂ) ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද 2024 අංක 01 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති මෙමගින් සංශෝධනය කරමින් එහි 4(v) දරන රීතිය අවලංගු කර පහත දැක්වෙන නව රීතිය ඒ සඳහා ආදේශ කරනු ලැබේ.

   "4(v) ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරනු ලබන, විදේශ මුදලින් නිරූපිත ණය සුරකුම්පත්වල ආයෝජනය සඳහා එසේ ලැබුණු අපනයන ආදායමෙන් ප්‍රතිශතාංක දහයක් දක්වා (10%) කරන ගෙවීම්; සහ"

EOG 01 - 0296